පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් සභාවේ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர் – வடமேற்கு மாகாண சபையின் அமைச்சகங்கள், துறைகள் மற்றும் சட்டப்பூர்வ நிறுவனங்கள்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No- 492

Name of the institution –Ministries, Departments and Statutory Institutions of the North Western Provincial Council

Submission observations of the Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of standing order No 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් සභාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස : 86.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ විගණන මතයක් ලබාදී ඇති අතර, විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.
සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව නියමිත දින තුල පළාත් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සියළු පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල තොරතුරු ඇතුළත්කර මෙම කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු මැයි 31 දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වුවද මෙම වාර්තාව 2024/07/31 දින විගණනය වෙත ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මාසයක් ඇතුළත පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට නොහැකි වූ විගණන වාර්තා බොහොමයක් පාසල් වලට අදාල විමසුම් වේ. අදාල පාසල් බලධාරීන් හා කළාප අධ්‍යාපන බලධාරීන් දැනුවත් කර විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට උපදෙස් ලබාදී ඇත. ඒ අනුව එම තත්වය අවමකර ගැනීමට කටයුතු කරමි.
අග්‍රිම ශේෂ වසරකට වඩා වැඩි කාලයකට රඳවාගෙන තිබුණි.	කර්මාන්ත සේවා කාර්යංශයට කොරෝනා වසංගත කාලයේදී වැටුප් ගෙවීම සඳහා අක්මුදල් ලබා දී ඇත. එය කොටස් වශයෙන් පියවූ අතර 2023/12/31 වන විට රු.1,000,000.00 ක මුදලක් තවදුරටත් පියවීමට ඉතිරිවී තිබුණි. එය 2024 වර්ෂයේදී සම්පූර්ණයෙන් පියවීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස.75.00	
ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නැත.	වයඹ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය මඟින් ස්ථාවර වත්කම් ලේඛනය සඳහා පරිගණක මුද්‍රිත පිටපතක් (Excel Sheet) මේ දක්වා පවත්වා ගෙන යනු ලැබේ.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නැත.	2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර 2023.01.24 දින අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.2023.02.07 දින ඒ සඳහා අනුමැතිය ලැබී ඇත.එමෙන්ම 2024/2025 වර්ෂවල ද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමැතිය ලබා ගෙන ඇත.
මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා නොදීම.	වයඹ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ලැබෙන විගණන විමසුම් උප කාර්යාල වෙත යවා පිළිතුරු ගෙන්වා ගැනීමෙන් අනතුරුව අවසන් පිළිතුර සකස් කරනු ලැබේ.පිළිතුරු ගෙන්වා ගැනීමේදී සිදුවන ප්‍රමාදය නිසා විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාද වී ඇත.මේ වන විට ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබාදීමට කටයුතු කර ඇත.
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි නොමැතිවීම.	වයඹ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාහන සංචිතයේ වාහන 61ක් (ජීප් -18,කැබ්-31,ලොරි-3,බස්-1,කුඩා වෑන්-2,යතුරු පැදි - 2, ට්‍රැක්ටර් - 2,ට්ලර් -2,) ඇත. උක්ත සියළුම වාහනවලට අදාලව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ සහතිකවල මුල් පිටපත් හෝ මුල් පිටපත් නොමැති අවස්ථාවල උඩෘත පිටපත් ලබා ගෙන ගොනු ගත කර ඇත. මෙම වාහන 61න් 4ක් අපහරණයට යෝජිත අතර අක්‍රීය වී ධාවනය ඇණහිටි වාහන 4ක් අලුත්වැඩියාවට යොමු කර ඇත. අනෙකුත් වාහන පවරා ගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම.	මෙම දෙපාර්තමේන්තුවට අයත් සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා අදාල මසට පසු මාසයේ 15 වන දිනට පෙර

	විගණකාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.එමෙන්ම ප්‍රමාද වී ලැබෙන වාර්තා අදාල මාසයට පසු මාසය අවසන් වීමට පෙර විගණකාධිපති කාර්යාලයට යැවීමට කටයුතු කර ඇත. ඒ අනුව මේ වන විට ලැබෙන සියළුම වාර්තා අදාල කාල සීමාව තුළ විගණකාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8ට වඩා අඩු කාලයකදී අපහරණය නොකිරීම.	වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ගර්හිත වාහන අපහරණ ක්‍රියාවලිය වාර්ෂිකව සිදු කරනු ලබන අතර මෙම දෙපාර්තමේන්තුව විසින් එම ක්‍රියාවලිය සෘජුවම සිදු නොකරයි.ඒ අනුව වාර්ෂික අපහරණය සඳහා ගර්හිත වාහන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ පසු අපහරණය කරනු ලැබේ.ඒ අනුව 2026 වර්ෂයට අදාල ඩයිහට්සු ජීප් 4ක් අපහරණය සඳහා තාක්ෂණ ඇගයීම් හා තක්සේරු කටයුතු මේ වන විට සිදු කර ඇත.
පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු නොකිරීම.	මේ වනවිට පළාත් සභා මුදල් රීති අනුව කටයුතු කරනු ලබයි.
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාදවීම.	වයඹ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ලැබෙන විගණන විමසුම් උප කාර්යාල වෙත යවා පිළිතුරු ගෙන්වා ගැනීමෙන් අනතුරුව අවසන් පිළිතුර සකස් කරනු ලැබේ.පිළිතුරු ගෙන්වා ගැනීමේදී සිදුවන ප්‍රමාදය නිසා විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාද වී ඇත.මේ වන විට ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබාදීමට කටයුතු කර ඇත.
වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබීම.	2024,2025 වර්ෂවල ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීමක් හෝ බැරකම්වලට එළඹීමක් සිදු කර නොමැත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	එම ණය ශේෂ පියවීමට කටයුතු කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගැනීම.	රජය විසින් උපාධිධාරීන් වෙත රැකියා ලබාදීම සඳහා විවිධ අවස්ථාවල ගන්නා ලද තීරණ අනුව මෙසේ සංවර්ධන නිළධාරීන්ගේ කාර්ය මණ්ඩල අතිරික්තයක් පෙන්වයි. නමුත් මෙම නිළධාරීන් සඳහා ආයතනය තුළ විධිමත්ව රාජකාරී පැවරීමක් සිදු කරන අතර නව කාර්ය මණ්ඩල සංශෝධනයේදී අදාල කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කරමි.

දෙවැනි කොටස . 60.00	
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම හා ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් නොකිරීම.	වර්තමානයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට මේ වන විට දැනුවත් කර ඇත.
පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම.	වයඹ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාලය සෘජුව මහජන සම්බන්ධතා පවත්වන ආයතනයක් නොවන බැවින්.පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කර නොමැත.පශු වෛද්‍ය කාර්යාල මඟින් සෘජුව මහජන සම්බන්ධතා පවත්වනු ලබන බැවින් එම කාර්යාල සඳහා පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.
ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කර ඇත.
මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් සහතික නොකිරීම.	පශු වෛද්‍ය නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශක නිලධාරීන් සඳහා පැය 12ක පුහුණු වැඩ සටහනක් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත.2024 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ධාරිතා පුහුණු වැඩ සටහන් පවත්වා ඇත. නිලධාරීන්ගේ කැමැත්ත පරිදි පුහුණු අවස්ථා ලබා දී ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට අයත් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වී නොතිබීම.	ගිවිසුම් පත්‍ර දැනට ක්‍රියාත්මක නොවේ.
සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් සියයට 50කට වඩා අඩු මට්ටමක පුහුණු ලබාදීම.	පශු වෛද්‍ය, සත්ත්ව සංවර්ධන උපදේශක නිලධාරීන් සඳහා වර්ෂය තුළ සියළු දෙනාටම පුහුණු අවස්ථා ලබා දී ඇත.දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා ලබා දෙන ලද්දේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ පුහුණු වැඩසටහන් සඳහා අයදුම් කිරීම මඟිනි. මෙහිදී ඉල්ලුම් කරන සියළු දෙනා සඳහා පුහුණු අවස්ථා හිමි නොවන අතර දෙපාර්තමේන්තුවේ සිදු කරන විවිධ වැඩ සටහන් මඟින් පුහුණුව ලබා දී ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ වීම.	තත්ත්වාගණනය කල මතයක් ලැබී ඇති අතර විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස- 77.00	
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදි පිළියෙල කර නොතිබුණි.	පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙන් මෙම අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදි පිළියෙල කරන බව දන්වමි.
මසක් තුල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිලිතුරු නොසැපයූ අවස්ථා නිරික්ෂණය විය	මෙම දෙපාර්තමේන්තුවට අයත් උප කාර්යාලවලින් පිළිතුරු ලබාගෙන දෙපාර්තමේන්තුවක් ලෙස පිලිතුරු සකස් කර ගැනිමේදි ප්‍රමාදයන් සිදුවන බවත්, මේ වන විට එම ප්‍රමාදයන් වලක්වා ගෙන කටයුතු කරන බවත් දන්වමි.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් සහකාර විගණකාධිපති වෙත යොමු කර ඇති බව දන්වමි.
සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	ආයතනය සතු වාහන වලින් මෙම දෙපාර්තමේන්තුවේ නමට අයිතිය නොමැති වාහන දෙපාර්තමේන්තුව නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇති බවත්, සමහර වාහන අයිතිය ඇති ආයතන වෙත භාරදී ඇති බවද,සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලියාපදිංචි පොත් ආයතනය සතුව පවතින බවත් දන්වමි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි .	සියළුම වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා මාසිකව සහකාර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබයි
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි	අපහරණය කලයුතු වාහන අපහරණය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. එසේම සමහර වාහන අවශ්‍යතාවය අනුව වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදීමට කටයුතු කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.	මේ වන විට නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කරන බව දන්වමි.
අක්මුදල් සැසඳුම් ප්‍රකාශය අනුව අනාවරණය වී තිබුණු වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.	මෙම වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට කටයුතු කල බව දන්වමි.
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයිම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරිම් නිරික්ෂණය විය.	මෙම දෙපාර්තමේන්තුවට අයත් උප කාර්යාලවලින් පිළිතුරු ලබාගෙන දෙපාර්තමේන්තුවක් ලෙස පිලිතුරු සකස් කර ගැනිමේදි ප්‍රමාදයන් සිදුවන බවත්, මෙ වන විට එම ප්‍රමාදයන් වලක්වා ගෙන කටයුතු කරන බවත් දන්වමි.

මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	ඉදිරියේදී බැරකම් සහ වැය ප්‍රමාණය ප්‍රතිපාදන සීමාවන් තුල ගෙවීම් සිදු කරන බව දන්වමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුණි.	2023 වර්ෂයට අදාලව හිග ණය ශේෂ නොතිබූ බව දන්වමි
දෙවැනි කොටස - 69.00	
සියළු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි.වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකල අදාළ නිලධාරින් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	සියළු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත්කර ඇති බව දන්වමි.ප්‍රමාද වී ලබාදුන් වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධයෙන් අදාල බලධරයා දැනුවත්කර ඇති බව දන්වමි.
ආයතන සංග්‍රහයේ 111 පරිච්ඡේදයේ 3.8.3. වගන්තියේ විධිවිධාන පූර්ණ වශයෙන් ඉටු නොකර මාරුවිම සම්බන්ධව කටයුතු කර ඇත.	ආයතන සංග්‍රහයේ 111 පරිච්ඡේදයේ 3.8.3. වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි.
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛණ පවත්වා නොතිබිණි.	මෙම ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛණයක් මේ වන විට නඩත්තු කරගෙන යන බව දන්වමි.
ආයතනය පිලිබඳව මහජනයාට තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	ආයතනය පිලිබඳව මහජනයාට තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යාම සඳහා කටයුතු කරමින් පවතී.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසාදි නොතිබුණි	මෙම වෙබ් අඩවිය ගොඩ නැගීමේදී මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන බව දන්වමි.
ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	මෙම ක්‍රමවේදය මෙ වන විට සකස් කරමින් පවතින බව දන්වමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය.	මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම් කරන මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිඹු කරන බව මෙම දෙපාර්තමේන්තුව සඳහා ලැබීඇති විගණන මතය වේ.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇති බව දන්වමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-75.00	
වර්ෂයට අදාළ පළාත් සභා නිලධාරීන් සඳහා වන අත්තිකාරම් ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර නැත	2024 සහ 2025 වර්ෂ වල දී නියමිත දිනට ඉදිරිපත් කර ඇති අතර ඉදිරි වර්ෂ වල දීද එසේ නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
පුද්ගල පඩිනඩි ලේඛනය / පුද්ගල කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි	මේ වන විට පඩි නඩි ලේඛණය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය	විගණන විමසුම් වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ පාසල් සඳහාය. එම විමසුම් කලාප හා දෙපාර්තමේන්තු අධීක්ෂණයෙන් පසු ජාතික හෝ අභ්‍යන්තර විගණන කාර්යාලය වෙත යවනු ලබයි. මෙම ක්‍රියාවලිය සඳහා සැළකිය යුතු කාලයක් ගතවේ. කෙසේ නමුත් විගණන විමසුම් සඳහා ප්‍රමාදයකින් තොරව කඩිනමින් පිළිතුරු සපයන ලෙස විදුහල්පතිවරුන්ව කලාප අධ්‍යක්ෂවරුන් මගින් දනුවත් කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 08 ට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි	පළාත් සභාවේ වාහන අපහරණය ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් සිදුකරනු ලබන අතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාලව අපහරණය කළයුතු වාහන හඳුනාගෙන ප්‍රධාන ලේකම් වෙත බාරදී ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි	2023 වර්ෂයේ අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මු.රෙ. ප්‍රකාරව නිරවුල් කර ඇත.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි	වර්තමානයේ දී කාර්යය නිම වී දින 14 ක් ඇතුළත අතුරු අග්‍රිම නිරවුල් කිරීම සිදු කරනු ලබයි.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධව ලිඛිතව අදාළ පුද්ගලයින්/ සමාගම් සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කර ඇත. 2026.12.31 වන දිනට පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	විගණන විමසුම් වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ පාසල් සඳහාය. එම විමසුම් කලාප හා දෙපාර්තමේන්තු අධීක්ෂණයෙන් පසු ජාතික හෝ අභ්‍යන්තර විගණන කාර්යාලය වෙත යවනු ලබයි. මෙම ක්‍රියාවලිය සඳහා සැළකිය යුතු කාලයක් ගතවේ. කෙසේ නමුත් විගණන විමසුම් සඳහා ප්‍රමාදයකින් තොරව කඩිනමින් පිළිතුරු සපයන ලෙස විදුහල්පතිවරුන්ව කලාප අධ්‍යක්ෂවරුන් මගින් දනුවත් කර ඇත.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි	සෑම වර්ෂයකම දෙසැම්බර් මස වියදම් ජනවාරි මාසය තුළ දී ගෙවීම සිදු කරන බැවින් වර්ෂයක් තුළ මාස 12 ක ගෙවීම සිදු කරයි.මෙය සෑම වර්ෂයකම සිදු වේ. 2026 වර්ෂය වන විට සීමාව ඉක්මවා බැරකම්වලට බැඳීම් සිදුනොකිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	සේවය හැර ගිය සේවකයින් දෙදෙනකුගේ පමණක් හිඟ ණය ශේෂ පවතින අතර 2026 වර්ෂය අවසානයේ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි	රජය විසින් උපාධිධාරීන් වෙත රැකියා ලබාදීම සඳහා විවිධ අවස්ථාවල ගන්නා ලද තීරණ අනුව මෙසේ සංවර්ධන නිළධාරීන්ගේ කාර්ය මණ්ඩල අතිරික්තයක් පෙන්වයි. නමුත් මෙම නිළධාරීන් සඳහා ආයතනය තුළ විධිමත්ව රාජකාරී පැවරීමක් සිදු කරන අතර නව කාර්ය මණ්ඩල සංශෝධනයේදී අදාල කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කරමි.

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
දෙවැනි කොටස-82.00	
සියලු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	2024/2025 වර්ෂ වල වත්කම් හා බැරකම් ඉදිරිපත් කළ යුතු සියලු නිලධාරීන් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරින් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි	2026 වර්ෂයේ සිට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත මාර්ගගත ක්‍රමය යටතේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට නිලධාරීන් දැනුවත් කර ඇත.
නිලධාරින්ගෙන් රජයට හෝ පළාත් සභාවට සිදු වූ පාඩු පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි	පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති සිද්ධි සම්බන්ධයෙන් හානි පාඩු පූර්ණය කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018/1 යටතේ කාර්ය සාධන ගිවිසුම් චක්‍රලේඛය අවලංගු වී ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය	තත්වාගණනය කළ මතයකි. තත්වාගණනය කළ මතය සඳහා පදනම වශයෙන් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස - 92.00	
සියලුම වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	වාහනවල අයිතිය පවරා ගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නියමිත දිනයන්ට විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබයි.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023/08/31 දිනට කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර ඇත.මේ වන විට නිරවුල් නොවූ ශේෂ නොමැත.
වර්ෂයට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වැඩි කාලයක් පැවති හිඟ ණය ශේෂ 2024.12.31 දිනට නිරවුල් කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	රජය විසින් උපාධිධාරීන් වෙත රැකියා ලබාදීම සඳහා විවිධ අවස්ථාවල ගන්නා ලද තීරණ අනුව මෙසේ සංවර්ධන නිළධාරීන්ගේ කාර්ය මණ්ඩල අතිරික්තයක් පෙන්වයි. නමුත් මෙම නිළධාරීන් සඳහා ආයතනය තුළ විධිමත්ව රාජකාරී පැවරීමක් සිදු කරන අතර නව කාර්ය මණ්ඩල සංශෝධනයේදී අදාල කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කරමි.

දෙවැනි කොටස-67.50	
ආයතන පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.	2025 වර්ෂයේ සිට නව වෙබ් අඩවිය නිර්මාණය කර ඇති අතර,වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ.
ආයතනයේ පවත්වා ගෙන යනු ලබනු වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	2025 වර්ෂයේ සිට නව වෙබ් අඩවිය නිර්මාණය කර ඇති අතර,වෙබ් අඩවිය තුළ මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා පහසුකම් සළසා ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	කාර්ය මණ්ඩලයේ සියළු දෙනාම පුහුණු පැය 12 සම්පූරණ කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2023 වර්ෂයේ සිට මෙම කාර්ය සාධන ගිවිසුම ක්‍රියාත්මක නොවන බව කාරුණිකව දන්වමි.(රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 02/2018(I))
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නුපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතන තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	පරිපාලන නිලධාරි වෙත වගකීම පවරා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2024/2025 වර්ෂ වල පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය 75% මට්ටමේ පවති.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023 මූල්‍ය ප්‍රකාශය සඳහා තත්වාගණනය කළ මතයක් ලබා දී ඇත. විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාත් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ඩීවර, සත්ව නිෂ්පාදන හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස - 92.00	
මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	මේ වන විට එවනු ලබන සියලුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ.
වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අමාත්‍යාංශය සතු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි ලේඛන (ලියාපදිංචි සහතික) පවතින අතර අමාත්‍යාංශය වෙත පවරා නොගත් වාහන වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	පළාත් මූල්‍ය රීති 261.2.2 අනුව අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන්, උපයෝජනය කල පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	වර්ෂයට අදාළ ප්‍රතිපාදන සලකා බලා විධිමත් ව ගෙවීම් කටයුතු කිරීමට ක්‍රමවේද ක්‍රියාත්මක කොට ඇත.
ඇතැම් වැය විෂයයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම මඟින් ප්‍රතිපාදන 100% ක් ඉතිරිවීම වලක්වා ගැනීමට කටයුතු කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	2026.04.30 දිනැති රා.ප.ව.ලේ. අංක 11/ 2026 මඟින් උක්ත තනතුර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසී ඇති බව නිරීක්ෂණය වන බැවින් ඒ සඳහා අදාළ කටයුතු සිදුකරමින් පවතින බව සඳහන් කරමි.

දෙවැනි කොටස-72.00	
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 06 දෙනෙකු සේවයේ යෙදී සිටින අතර ඔවුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.

2018.01.24 දිනැති අංක 05/2018(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර ඇති අතර එය ක්‍රියාත්මක තත්වයේ පවතී.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් සිදුවීම පිළිබඳ අධීක්ෂණය කිරීම සහ ඇගයීම අංශ මට්ටමින් අදාල මාණ්ඩලික නිලධාරීන් මගින් සිදු කිරීමට කටයුතු යොදා ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි වර්ෂයකදි එක් අයෙකු සඳහා අවම පැය 12 ක පුහුණු අවස්ථාවක් ලබාගත හැකි වන පරිදි පුහුණු අවශ්‍යතා සඳහන් කිරීම සහ එම පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩල උනන්දු කරවීමට (කාර්ය සාධන වාර්තාව ඇගැයීමට ලක් කිරීමේදී ලකුණු දීමේ ක්‍රමවේදය මඟින්) කටයුතු සිදු කර ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් සකස් කර තිබූ නමුත්, එම ගිවිසුම් අත්සන් යොදා සහතික කර නොතිබුණු බැවින් එම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම , ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී මානව සම්පත් සංවර්ධනයට අදාල රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා සංවර්ධන නිලධාරියෙකු නම් කර එම නිලධාරියා පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කිරීම හා සහකාර ලේකම් (ආයතන) මගින් එම කටයුතු අධීක්ෂණය කිරීම සිදු වෙමින් පවතී.
සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා එකම මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර අනුමත කර තිබුණි. එහි විගණනය මඟින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කරමින් 2026 වර්ෂය සහ ඉන් ඉදිරියට මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු යොදා ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2025 වන විට ආයතනයේ ගිණුම් පිළිබඳ යහපත් විගණන මතයක් ලැබී ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස - 86.00	
මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	සහකාර කොමසාරිස් කාර්යාල හතරෙන්(04) අතුරු පිළිතුරු කැඳවා තොරතුරු රැස් කර ගැනීමේදී යම් කාලයක් ගත වන බැවින් පිළිතුරු යැවීම ප්‍රමාද වුවද, හැකි උපරිමයෙන් අවම කාලයකින් පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2025.12.31 දක්වා සංචිත වාහන ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සහකාර විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රධාන කාර්යාලය හා සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල හතරට (04) අදාල මාසික බැංකු සැසඳුම් ඉදිරි මාසයේ 15 ට පෙර පිළියෙල කර එහි පිටපත් සහකාර විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරන අතර එය ගණකාධිකාරි විසින් අධික්ෂණය කරනු ලබයි.
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	සහකාර කොමසාරිස් කාර්යාල හතරෙන්(04) අතුරු පිළිතුරු කැඳවා තොරතුරු රැස් කර ගැනීමේදී යම් කාලයක් ගත වන බැවින් පිළිතුරු යැවීම ප්‍රමාද වුවද, හැකි උපරිමයෙන් අවම කාලයකින් පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	සනීපාරක්ෂක කම්කරු, ටී.එච්.ඩී.විමලරත්න මයා විසින් 2014.07.01 දිනැතිව ලබාගෙන ඇති උත්සව අත්තිකාරම් මුදල රු.6,250.00 සමුපකාර අමාත්‍යාංශ ලේකම්ගේ අංක NWP/MOCD/ACC03/37-10 හා 2025.03.25 දිනැති ලිපිය මඟින් කපාහැරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. සේවය හැර ගොස් සිටින එම්.අයි.එම්.ෆිරෝස්ඩීන් මයාගේ රු.97,885.00ක හිඟ ණය ශේෂය තවදුරටත් අයකර ගැනීමට ඇති හැකියාව සම්බන්ධව ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව දන්වමි.

දෙවැනි කොටස - 85.00	
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට සියලුම විධායක නිලධාරීන්ගේ හා මාණ්ඩලික නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ පත්වීම් බලධරයා වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධාරියා දැනුවත් කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට නිවැරදිව වත්කම් හා බැරකම් ප්‍රකාශ සියළු නිළධාරීන් ලබාදී ඇත. එසේම 2023 වර්ෂයේ පමාවී ඉදිරිපත් කිරීම් වාර්තාකර ඇත.
හදුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ලගා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	මේ වන විට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සාක්ෂාත් වන පරිදි ව්‍යාපෘති හදුනාගෙන ඊට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.
ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය, යටත්ම මට්ටමේ/ව්‍යවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	විගණකාධිපති වාර්තාවේ 1.2 ඡේදයේ සඳහන් ගිණුම්කරණ අඩුපාඩු කිහිපයක් මත තත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.එහි පෙන්වා දුන් අඩුපාඩු සියල්ල මේ වන විට නිවැරදි කර ගිණුම්කරණ සටහන් පනවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-84 . 00	
මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	විගණන විමසුම් සඳහා සෞඛ්‍ය ආයතන හා විවධ අංශ මගින් කඩඉම් හරහා පිළිතුරු ලබා ගැනීමට සිදුවීම නිසා යම් ප්‍රමාදයන් සිදුවන බව පිළිගනිමි.
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	විගණන විමසුම් සඳහා සෞඛ්‍ය ආයතන හා විවධ අංශ මගින් කඩඉම් හරහා පිළිතුරු ලබා ගැනීමට සිදුවීම නිසා යම් ප්‍රමාදයන් සිදුවන අතර, සෞඛ්‍ය ආයතන දැනුවත් කර ඉදිරියේදී කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.
සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ පළමු ,දෙවන කාර්තුවලට අදාළව 2023/06/02 සහ තුන්වන කාර්තුවට අදාළව 2023/09/26 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති බව දන්වමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන භිග ණය ශේෂ පැවතුණි.	දීර්ඝ කාලයක් ගිණුමේ පවතින පැරණි ණය ශේෂයන් භාණ්ඩාගාර චක්‍රලේඛ 02/2024 අනුව ගැලපීමට කටයුතු කර ඇති බව දන්වමි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බදවා ගෙන තිබුණි.	2017 වර්ෂයේ අනුමත කරන ලද කාර්ය මණ්ඩලය අනුව මෙම අනුමත කාර්ය මණ්ඩලය නිරූපණය වේ. පුරප්පාඩු පවතින තනතුරු සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් නිළධාරීන් අනුයුක්ත කරනු ලබන අතර, අනුමත තනතුරු ලැයිස්තුවට අනුව අතිරික්තතා නිරූපණය වුවද පෙර වර්ෂයන්ට සාපේක්ෂව සෞඛ්‍ය සේවාවන් හා රෝහල් පද්ධතීන්වල සිදුකරන ලද වැඩි දියුණු කිරීම් හා නව ඒකක අලුතින් හඳුන්වා දීම මත එම කාර්ය මණ්ඩල ඒ ඒ අංශ වලට අනුයුක්තව සේවය කරනු ලබන අතර, වර්තමාන අවශ්‍යතාවයට අනුව අවශ්‍ය කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදු කර, නව තනතුරු ඇති කරලීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි.
කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා වෙත ලිඛිතව කාර්ය පැවරුම් කර නොතිබුණි.	සියලුම කාර්ය මණ්ඩල නිළධාරීන් වෙත ලිඛිතව රාජකාරි පැවරීම් සිදු කොට ඇති බව දන්වමි.

දෙවැනි කොටස-89.00	
සියලු නිළධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුතු සියලුම නිළධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ වාර්ෂිකව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.
නිළධාරීන්ගෙන් රජයට හෝ පළාත් සභාවට සිදු වූ පාඩු පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂය තුළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අදාළ නිළධාරීන්ගෙන් රජයට හෝ පළාත් සභාවට කිසිදු හානියක් හෝ පාඩුවක් සිදුව නොමැති බව දන්වමි.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අය කළ යුතු අධිභාර අය කර නොතිබුණි.	මෙම වර්ෂය තුළ පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අධිභාර කළ යුතු අවස්ථා නොතිබුණ බව කාරුණිකව දන්වමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ ,ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ පැවතීම.	දෙපාර්තමේන්තුව යටතේ පවතින ගොඩනැගිලි හා ඉඩම් කිහිපයකට අදාල තක්සේරු වාර්තා නොකිරීම මත ඒවා වත්කම් ලේඛනවල අන්තර්ගත නොවීම මත මෙම තත්වය සිදුවී ඇති අතර ,වර්තමානය වන විට පැහැදිලි මතයක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස : 89.00	
මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලාවලින් අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබාගෙන මසක් ඇතුලත අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය කටයුතු සිදු කරණ බව කාරුණිකව දන්වා සිටිමි.
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියළුම විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු ලිවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත .
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත ගෙන එන ණය ශේෂ නිරවුල් කර ඇත.
දෙවැනි කොටස : 92.00	
කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමර්ග/ වර්තමාන තත්වය
සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	ප්‍රමාද දෝෂයකින් 2023 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවේ වත්කම් බැරකම් ඉදිරිපත් කළ යුතු නිලධාරීන් විසින් එම වර්ෂය සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැති බවට කාර්යාල විෂය ගොනු අනුව තහවුරු වේ.2023 වර්ෂයේ වත්කම් බැරකම් විෂය සම්බන්ධයෙන් සේවය කරන ලද විෂය නිලධාරීන් මේ වන විට ස්ථාන මාරුවී ගොස් ඇති බවත් එවකට සිටි පරිපාලන නිලධාරී, පළාත් ආයුර්වේද කොමසාරිස් විශ්‍රාම ලබා ඇති බවත් දන්වා සිටින අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා බවත් කාරුණිකව දන්වා සිටිමි. 2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතු නිලධාරීන් 238 සහ 2025 වර්ෂයට අදාලව නිලධාරීන් 239 ද මේ වන විට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී ඇත.2026 වර්ෂය සඳහාද නියමිත පරිදි වත්කම් බැරකම් ඉදිරිපත් කරන ලෙසට ලිඛිතව එම නිලධාරීන්ව දැනුවත් කර ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි.
ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය	තත්ත්වාගණනය කළ මතයක් බව කාරුණිකව දන්වා සිටිමි. විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-94.00	
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වර්තමානය වන විට දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විධිමත්ව පවත්වාගෙන යනු ලබන අතර, විගණනය විසින් ඉල්ලා සිටින විට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි	වර්තමානය වන විට වර්ෂයක් තුළ පැවැත්වීමට නියමිත රැස්වීම් ප්‍රමාණය විධිමත් පරිදි පවත්වාගෙන යනු ලබයි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්තමානය වන විට හිඟ ණය ශේෂ පියවීමට කටයුතු කර ඇත.
දෙවැනි කොටස-89.00	
ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3.8.3 වගන්තියේ විධිවිධාන පූර්ණ වශයෙන් ඉටු නොකර මාරු වීම් සම්බන්ධව කටයුතු කර ඇත.	වයඹ පළාත් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන පරිදි සහ 2022.06.24 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් බලතල ප්‍රකාරව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරුවීම් මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර, වාර්ෂික ස්ථාන මාරු ඇතුළු අනෙකුත් ස්ථාන මාරු වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් සිදු කරනු ලබයි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි 1 ඡේදයට අනුව ආයතනයට සුදුසු ආකෘතියක් සකස් කර ගනු ලබන කාර්ය සාධන ගිවිසුම් ආකෘතිය අනුව ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා, වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු බව සඳහන් කර තිබුණද, 2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (I) මගින් I වන ඡේදය සංශෝධනය කරන අතර, එහි සඳහන් පරිදි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවන බව සඳහන් කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2025.12.31 දිනට යහපත් විගණන මතයක් ලැබී ඇත
පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණනය විසින් ලබා දුන් නිරීක්ෂණ අනුව වර්තමානය වන විට ක්‍රියාත්මක වීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස-88.00	
මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	මසක් ඇතුළත අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරමි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	විගණනයෙන් පෙන්වාදීමෙන් අනතුරුව 2023 වර්ෂයෙන් පසු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සහකාර විගණකාධිපති වෙත යොමු කිරීම සිදු කෙරෙන බව කාරුණිකව දැනුම් දෙමි.
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	මසක් ඇතුළත විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	සියළු ණය ශේෂ නිරවුල් කර ඇත.
දෙවැනි කොටස-95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ විගණන මතයක් ලබාදී ඇති අතර, විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස : 90.00	
පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ වසර 02 ඉක්මවූ තැන්පත් 2026.03.31 දිනට අයිතම 26 ක් සඳහා රු. 12,533,075.09 ක් පවතින අතර මෙම තැන්පත් ජලනල දීර්ඝ කිරීම් සඳහා මාර්ග පළුදු කිරීම වෙනුවෙන් ලබාගන්නා තැන්පත්, වැලි, පස්, බොරළු ප්‍රවාහනය සඳහා බරවාහන බලපත්‍ර සඳහා තැන්පත් හා මාර්ගය දෙපස රැහැන් ඇදීම සඳහා අවසර දීමේදී ලබාගන්නා තැන්පතු ආදිය වේ. අදාල කාර්යය/ගිවිසුම් කාලය නිමවන තෙක් මෙම තැන්පත් නිදහස් කිරීම සිදුකල නොහැකි බැවින් මෙම තැන්පත් වසර 2 ක් ඉක්මවුවද නිදහස් කල නොහැකි බව කාරුණිකව දන්වමි. අදාල කාර්යය නිමවූ වහාම මෙම මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි.
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම	විධායක ඉංජිනේරු කාර්යාලවල ප්‍රමාණවත් කාර්මික නිලධාරින් නොමැතිකමින් විශාල කාර්ය භාර ප්‍රමාණයක් එක් නිලධාරියකු වෙත පැවරී ඇත. ක්ෂේත්‍ර ගණනාවක විවිධ ක්‍රියාවලින් පිළිබඳ කටයුතු කිරීමේදී ඔවුන්ට විගණන විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව භෞතිකව සොයාබැලීමට ලැබෙන කාලය ඉතාමත් අඩුය. විගණන විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු සොයා බැලීමකින් තොරව පිළිතුරු ලබාදීම සාධාරණ නොවන බව දන්වමි. එබැවින් මාර්ග වලට අදාල විගණන විමසුම් වලට පිළිතුරු ලබාගැනීමේදී යම් ප්‍රමාදයක් පැවතීම නොවැලැක්විය හැකි කරුණක් බව පෙන්වා දෙමි. තවද පසුගිය දිනවල පැවති දිට්වා සුලිකුණාටු තත්ත්වය හේතුවෙන් අබලන් වූ මාර්ග යථාවත් කිරීම ප්‍රමුඛ රාජකාරියක් බවට පත්ව තිබුණි. එම කටයුතු වල නිරතවීම හේතුවෙන් යම් ප්‍රමාදයක් සිදුව ඇති බව පිළිගනිමි. ඉදිරියේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.
දෙවැනි කොටස : 93.00	
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබීම.	මේ වන විට යාවත්කාලීනව පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	මෙම දෙපාර්තමේන්තුවේ 2024 හා 2025 වර්ෂ සඳහා වූ විගණකාධිපති වාර්තාවෙහි හිතකර මතයක් ලබාගෙන ඇති අතර එම තත්ත්වය ඉදිරියටත් පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-95.00	
සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	මෙම දෙපාර්තමේන්තුවට අයත් වාහන පවරාගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතී.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පවතින ක්ෂේත්‍ර රාජකාරී සඳහා දී ඇති වාහන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2023 වර්ෂයේ ගර්හිතව තිබූ වාහනය නැවත ධාවනයට සුදුසු තත්වයට අළුත්වැඩියාකර භාවිතා කරනු ලබයි. ඒ අනුව එම වාහනය අපහරණ ලේඛනයෙන් ඉවත්කල බව කාරුණිකව දන්වමි.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	මාසික බැංකු සැසඳුම් වාර්තා මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ගෙන්වා ගැනීම , මැයෙන් යුතු ප්‍රධාන ලේකම්ගේ අංක NWP/CS/F/ හා 2022.06 දිනැති ලිපියට අනුව, එකල රටේ පැවති තත්වය මත ලිපි ද්‍රව්‍ය මිල ගණන් සීග්‍රයෙන් ඉහල යෑම නිසා බැංකු සැසඳුම් පිළියෙල කිරීමෙන් පසු එක් පිටපතක් පමණක් ලබා ගෙන scan කර පිටපත Google Form මගින් ඉදිරිපත් කරන ලෙසත් , විගණකාධිපති වෙතත් , අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙතත් පළාත් භාණ්ඩාගාරය විසින් මාසිකව ඒකාබද්ධ කල මෘදු පිටපත ලබා දීමට කටයුතු කරන බවත් දන්වා ඇත. ඒ අනුව එදින සිට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර scan කරන ලද පිටපත Google Form මගින් පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරඇත. විගණනය මගින් මේ බව දැනුම්දීමෙන් පසු මේ වන විට සෑම මසකම බැංකු සැසඳුම් ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	2025.03.31 කාර්තුව වන විට අනුමත සීමාව ඉක්මවා තිබූ කාර්යය මණ්ඩලය අනුමත සීමාව දක්වා අඩුකර ඇත.

දෙවැනි කොටස-90.00	
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මෙම දෙපාර්තමෙන්තුවේ වත්කම් බැරකම් ඉදිරිපත් කල යුතු නිලධාරීන්ගෙන් නිලධාරීන් සිවුදෙනෙකුගේ වත්කම් බැරකම් ප්‍රකාශ නියමිත දිනය ඉකුත්වීමෙන් පසු ඉදිරිපත් කර ඇති අතර අනෙක් නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ නිවැරදි දිනට ප්‍රථම ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වන අතර මේ වන විට නියමිත කාලය ඉක්මවීමට පෙර අදාළ නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර ගිවිසුම් ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 02/2018 (1) අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තා මගින් නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා ධාරිතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා එමගින් ඔවුන්ගේ කාර්ය සාධනය ඉහල නැංවීම අපේක්ෂා කරන බවත් ඒ අනුව දීර්ඝකාලීන මානව සම්පත් සංවර්ධන සැළැස්මක් පිළියෙල කිරීම සුදුසු බැවින් ඒ සඳහා චක්‍ර ලේඛය මගින් ඉදිරිපත් කර ඇති මාර්ගෝපදේශය අනුව කටයුතු කරන ලෙසත් දන්වා ඇති අතර වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවන බවත් දන්වා ඇත. එබැවින් 2023 වර්ෂයේ සිට සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුලත්ව වාර්ෂිකව කාර්ය සාධන ගිවිසුම් ගතව නොමැති බව කාරුණිකව දන්වමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ / ව්‍යවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	ඉදිරියේදී ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය හිතකර මට්ටමේ මතයක් ලබා ගැනීම වෙනුවෙන් විගණනය පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කරමින් මූල්‍ය රීති , ආයතන සංග්‍රහය, චක්‍රෙල්ඛ, විධි විධාන පරිදි කටයුතු කිරීමට වග බලා ගන්නා බව කාරුණිකව දන්වමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් සභා ලේකම් කාර්යාලය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස-99.00	
ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	2023 වර්ෂයේ පළාත් සභාවක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 03-01 ව්‍යාපෘතියේ ඇතැම් වැය විෂයන් සඳහා ලබා දී තිබූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම ඉතිරි විය. (2018.10.10 සිට මේ දක්වා පළාත් සභාවට සභිකයින් පත්කර නොමැත.)

දෙවැනි කොටස-87.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2025 වර්ෂයේ යහපත් විගණන මතයක් ලැබී ඇත.
පළාත් ගිණුම් පිලිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙම කාර්යාලයට අදාළව පළාත් ගිණුම් කාරක සභාවේ නිර්දේශ /නියෝග ඉදිරිපත් කර නොතිබුණි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස - 98.00	
බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් වයඹ පළාත් ඉංජිනේරු අධ්‍යක්ෂකගේ ගිණුමට බැර කරන ලද මුදලක් හඳුනාගනු නොලැබූ ලැබීමක් ලෙස සඳහන්ව ඇති නමුත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ලිපිය ලද වහාම එම නොගැලපීම නිවැරදි කරන ලදී.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතයක් ලැබී ඇති අතර විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස : 98.00	
රැස්කළ ආදායම් අදාළ විධිවිධාන වලට අනුකූලව ආපසු ගෙවා නොතිබුණි	පළාත් පාලන දෙපාර්තමේන්තුව ආදායම් රැස් කරන දෙපාර්තමේන්තුවක් නොවේ.
දෙවැනි කොටස : 90.00	
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	පළාත් පාලන දෙපාර්තමේන්තුවේ SL 1 බණ්ඩයේ වැටුප් ලබන සියළු මාණ්ඩලික නිළධාරීන් 2023.03.31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී ඇති අතර 2023.08.16 වන විට ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොකළ නිළධාරීන් අදාළ නිළධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අයකළ යුතු අධිභාර අයකර නොතිබුණි.	නවගත්තේගම ප්‍රාදේශීය සභාවට අයත් සම්පූර්ණ අධිභාර මුදල 2026.03.10 දින වන විට අයකරගෙන අවසන් කර ඇත. තව දුරටත් අයකර ගැනීම සඳහා නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවට අයත් අධිභාර සහතික 02ක් ඇති අතර ඒ සම්බන්ධව පළාත් පාලන අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය	2023 වර්ෂයේ ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය තත්වාගණනය කල මතයකි. විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස : 95	
පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ විශ්‍රාම වැටුප් අනුමත වූ පසු විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. වැඩ තහනම් කර ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ අතුරින් එක් අයකුගේ හිඟ ණය ශේෂය අධිකරණ නීන්දුවකට අනුව රු.15,000.00ක මාසික වාරික වශයෙන් අය කරමින් පවතී. අනෙක් නිලධාරිනියගේ ණය ශේෂය, විනය නියෝගය අනුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් ලබා දුන් අනුමැතිය පරිදි විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	රා.පරි.ව.25/2014අනුව අනියම්/ ආදේශක සේවකයින්ගේ සේවය ස්ථිර කිරීම යටතේ දෙදෙනෙකු කර්මාන්ත උපදේශක තනතුරු 02ක් සඳහා බඳවා ගෙන ඇත. මෙම නිලධාරීන් ගේ තනතුරු කාර්යමණ්ඩලය සඳහා අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා තෙක් ඉදිරි කටයුතු කිරීමට හැකියාවක් නොමැති බව දන්වා ඇත.
දෙවැනි කොටස : 95	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව සඳහා තත්වාගණනය කළ මතයක් ලබා දී ඇති අතර, එම මතය සඳහා පදනම ලෙස දක්වා ඇති අඩුපාඩු ඉදිරියේදී සිදු නොවන ලෙස එම කටයුතු පවත්වා ගෙන යාමට පියවර ගෙන ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් සමූපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලි බල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-98.00	
ස්ථාවර වත්කම් ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නැත.	ස්ථාවර වත්කම් ලේඛණය නිසි පරිදි යාවත්කාලීන කර ඇත.

දෙවැනි කොටස-92.00	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නිසි පරිදි මානව සම්පත් සැලසුම පිළියෙල කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ විගණන මතයක් ලැබී ඇති ඇත. පෙන්වා දී ඇති අඩුපාඩු අවම කරගනිමින් යහපත් විගණන මතයක් ලබාගැනීමට කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස : 96	
ස්ථාවර වත්කම් ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නැත.	ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
අක්මුදල් ඉල්ලුම්පත්‍රය නියමිත දිනට නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි.	අක්මුදල් ඉල්ලුම්පත්‍රය නියමිත දිනට නියමිත පරිදි මේ වන විට ඉදිරිපත් කරන ලදී.
දෙවැනි කොටස : 95	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගනන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	යටත්ව මට්ටමේ විගණන මතයක් ලැබී ඇති අතර විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-98.00	
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	මෙම දෙපාර්තමේන්තුව වෙත විගණන නිලධාරී තනතුරු 20ක් අනුමත වී ඇති අතර නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එම කටයුතු සිදුකරමින් පවතී. එතෙක් දෙපාර්තමේන්තුවේ කටයුතු සංවර්ධන නිලධාරීන් 20 දෙනෙකු මගින් සිදුකරගනු ලබයි.
දෙවැනි කොටස-94.00	
ආයතන සංග්‍රහයේ පරිච්ඡේදයේ 3.8.3 වගන්තියේ විධි විධාන පූර්ණ වශයෙන් ඉටු නොකර මාරුවීම් සම්බන්ධව කටයුතු කර ඇත.	වැඩි සේවා කාලයක් සහිත කළමනාකරන සේවා නිලධාරිනියක ස්ථාන මාරු වී ඇති අතර සංවර්ධන නිලධාරීන් විගණන නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය වීමට අපේක්ෂිතව සිටී.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2025 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවට විගණනයෙන් මතයක් ලැබී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස-97.00	
ඇතැම් වැය විෂයයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණ විය	පළාත් සභාවේ සංවර්ධන වැඩසටහන් වලට අදාලව කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කිරීම හා පස් අවුරුදු සැලැස්මේ වැඩසටහන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධ අරමුදලෙන් ලැබෙන මෙම ප්‍රතිපාදන පළාත් භාණ්ඩාගාරයෙන් වර්ෂය මුලදී ගෙන්වා ගෙන අවශ්‍ය අවස්ථා වලදී වියදම් කරනු ලබයි. නමුත් 2023 වර්ෂයේදී එක් වැය විෂයකට අදාලව පමණක් වියදම් දරා ඇති අතර ඉතිරි වැය විෂයයන් 02 ට අදාලව සම්පූර්ණ ප්‍රතිපාදනයට ඉදිරි වූ අතර වියදම් නොකල ප්‍රතිපාදන දෙසැම්බර් 31 දින වන විට පළාත් භාණ්ඩාගාරයට යවා ඇත. මෙම ප්‍රතිපාදන පළාත් සභාවේ වාර්ෂික ඇස්තමේන්තු තුලින් වෙන් කරනු ලබන ප්‍රතිපාදනයන් නොවන අතර එය එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලින් ලැබෙන ප්‍රතිපාදනයන් වන අතර එය ඉදිරි වර්ෂවල වියදම් සඳහා භාවිතා කරනු ලබයි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	2018 වර්ෂයේ සිට පැවති ආපදා ණය ශේෂය නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුල්‍ය)ගේ අංකNWP/CS/F/09/අන්තර් පළාත් 2023 හා 2023.07.07 දිනැති ලිපියෙන් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
දෙවැනි කොටස - 95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	වයඹ පළාත් ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙත් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වක් පිළිබිඹු කරන බව විගණන විමසුම් මතය වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස-97.00	
මසක් තුල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය වීම	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පරිවාස කාර්යාල හා ළමා නිවාස වලින්ද පිළිතුරු ගෙන්වා ගත යුතු බැවින් මේ සඳහා යම්කිසි කාලයක් ගත වේ. හැකි සෑම විටම කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.
දෙවැනි කොටස- 95.00	
ආයතනයේ ගිණුම් පිලිබඳ විගණන මතය ,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ වීම	2023 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව සඳහා තත්වාගණනය කල මතයක් ලබා දී ඇත. එහිදී පෙන්වා දී තිබූ අඩුපාඩු මේ වන විට නිවැරදි කර ගෙන ඇති බව සඳහන් කරන අතර මේ වන විට 2025 වර්ෂය සඳහා යහපත් මතයක් ලැබී ඇති බව කාරුණිකව සඳහන් කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කෙටස-99.00	
වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	අංක CAV 7182 දරණ මෙම වාහනය වයඹ ප්‍රධාන ලේකම්ගේ අංක NWP/CS/AD/18/31 හා 2022.03.10 දිනැති ලිපිය මගින් ජනාධිපති ලේකම් කාර්යාලයට ලබා දී ඇති අතර , එම කාර්යාලය විසින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ලබා දී ඇත. එම කාලය තුල (2022.05.09 දින) කොළඹ බේරේ වැව අසලදී මෙම අනතුර සිදුවී ඇති අතර අනතුරට අදාළ රක්ෂණ වන්දි ලැබීම් ද අවසන්ව ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ කටයුතු අවසන්ව නොමැති බැවින් මු.රෙ.104(4) අවසන් වාර්තාව ලබා දීම ප්‍රමාද වන බව අදාළ අමාත්‍යාංශය මගින් දැනුම් දී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ අවසන් වූ වහාම එම වාර්තා පදනම් කරගෙන ඉදිරි කටයුතු කරමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතයක් ලැබී ඇති අතර විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් සෞඛ්‍ය,දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස - 94.00	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	අදාළ නිලධාරීන්ගෙන් ලිඛිත පිළිතුරු ලබා ගැනීමේ දී නිශ්චිත දිනට පිළිතුරු විෂයභාර නිලධාරියාට ඉදිරිපත් නොවීම හා සකස් කරන ලද පිළිතුරු ප්‍රධාන ගණකාධිකාරිගෙන් හා අමාත්‍යාංශ ලේකම්ගේ පරීක්ෂාවට ලක්කරන බැවින්, ඒ සඳහා අමතර සති දෙකක පමණ කාලයක් ගත වී ඇත. මෙම තත්ත්වය නැවත ඇති නොවීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නෙමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස - 95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරගෙන යනු ලැබේ. ඒ අනුව 2025 වර්ෂය සඳහා යහපත් විගණන මතයක් ලැබී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
දෙවැනි කොටස - 95	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන / අභිතකර මට්ටමේ විය.	යටත්ව මට්ටමේ විගණන මතයක් ලැබී ඇති අතර විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාත් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම- වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
දෙවැනි කොටස - 95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂය සඳහා මෙම කාර්යාලය වෙත විගණනය විසින් ලබා දී ඇති විගණන මතය, තත්වාගණනය කළ මතයකි. ඉහත විගණන මතය සඳහා පදනම් වී ඇති කරුණු සහ ඒවායේ වර්තමාන තත්ත්වය පහත පරිදි ඉදිරිපත් කරමි. <u>විගණන මතය සඳහා පදනම් වී ඇති කරුණු -</u> **<u>1.2.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අඩුපාඩු</u>** **(අ).** මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ1(ii) ආකෘතියේ මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීමේදී මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර වෙනස මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතය ලෙස සියයට 14911 ක් විය යුතු වුවද, එය සියයට 0.66 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබීම. <u>වර්තමාන තත්ත්වය -</u> මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ1(ii) ආකෘතියේ මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර වෙනස ගණනය කිරීමේ දෝෂය නිවැරදි කර ඇත. **(ආ).** සමාලෝචිත වර්ෂයට අදාලව 2024 වර්ෂයේ ගෙවන ලද රුපියල් 27,415.00 ක් වූ ගෙවිය යුතු බිල්පත් මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ - 08 ආකෘතියේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබිණි. <u>වර්තමාන තත්ත්වය -</u> මූල්‍ය ප්‍රකාශනය භාණ්ඩාගාර උපදෙස් අනුව නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර, ඉදිරි වර්ෂවලදී අදාළ ගැලපීම් නිවැරදිව සිදු කිරීම උපදෙස් ලබාදී ඇත. **(ඇ).** මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ - 06 ආකෘතියේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වැය විෂය අංක 2102 යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ ශේෂය රුපියල් 12,999,445.00 වූවද, භාණ්ඩාගාර මුද්‍රිත පිටපතෙහි එය රුපියල් 13,002,445.00 ක් වූ බැවින් රුපියල් 3,000.00 ක නොසැසඳීමක් විය. <u>වර්තමාන තත්ත්වය -</u> කාර්යාලීය පුටු 02ක අපහරණ වටිනාකම වන රු. 3,000.00ක

	අදාළ ගැලපීම මුල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය 2023 සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නිවැරදි බවට සනාථ කර ගැනීමෙන් අනතුරුව ඒසීඒ - 06 ආකෘතියට ඇතුලත් කර තිබිණි. මූල්‍ය ප්‍රකාශනය සහ භාණ්ඩාගාර උපදෙස් අනුව ඉදිරි වර්ෂවලදී අදාළ ගැලපීම් නිවැරදිව සිදු කිරීමට උපදෙස් ලබාදී ඇත. **2.මූල්‍ය සමාලෝචනය** **2.1 වියදම් කළමනාකරණය** ශුද්ධ ප්‍රතිපාදනය සහ ඉතිරිවීම් සැසඳීමේදී වැය විෂයන් 05 ක එකතු වටිනාකම රු.1,415,000.00 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.804,958.00 ක් ඉතිරිවීම් කර තිබූ අතර, එය සියයට 19 සිට 89 දක්වා පරාසයක විය. ඒ අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රකාශය සාර්ථක මූල්‍ය පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබිණි. වර්තමාන තත්ත්වය - 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරණ අයවැය චක්‍රලේඛය උපදෙස් හා විධිවිධාන අනුව නිකුත් කරන ලද 2023.03.01 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 01/2023 හි 02 පරිච්ඡේදය ප්‍රකාරව 6% ඉතිරි කිරීම් සිදු කර ඇත. මූල්‍ය ප්‍රකාශනය සහ භාණ්ඩාගාර උපදෙස් අනුව ඉදිරි වර්ෂවලදී අදාළ ගැලපීම් නිවැරදිව සිදු කිරීම උපදෙස් ලබාදී ඇත **3. මෙහෙයුම් සමාලෝචනය** **3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා** (අ) 2015,2016 වර්ෂයන්හි සිට පැවත එන 2020 හා 2021 වර්ෂයන්හිදී චෝදනා පත්‍ර නිකුත් කරන ලද, විනය පරීක්ෂණ ගොනු 02ක් සම්බන්ධයෙන් විගණන අවස්ථාව වූ 2024 ජනවාරි 17 වන විටත් කටයුතු අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. වර්තමාන තත්ත්වය - කළමනාකරණ සේවා අධිපන්තියේ නිලධාරී කෙ.පී.අයි. මල්කාන්ති මිය සම්බන්ධ විනය පරීක්ෂණ අවසන් කර අවසන් වාර්තාව නියෝග ලබා ගැනීම සඳහා 2023.12.07 දින වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත අතර, 2024.09.04 දින විනය නියෝග නිකුත් කර අදාළ පාර්ශවයට දැනුම්දී ඇත. පේෂකර්ම උපදේශක ජී.එම්.ඥනවතී මිය සම්බන්ධ විනය පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව නියෝග ලබා ගැනීම සඳහා 2024.03.28 දින වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති අතර, 2024.07.30 දින විනය නියෝග නිකුත් කර අදාළ පර්ශවයට දැනුම්දී ඇත. (ආ) නිලධාරීන් 10 දෙනෙකු සම්බන්ධයෙන් චෝදනා පත්‍රය නිකුත් කිරීම හා විනය නියෝග ලබා දීම අතර අවුරුදු 02ත් 3½ ත් අතර කාල ප්‍රමාදයක් පවතින අවස්ථා පැවතුණි. වර්තමාන තත්ත්වය -

	විගණන විමසුමට ලක්වී ඇති විනය පරීක්ෂණ සම්බන්ධ විධිමත් විනය පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති උපරිම මාස 02 ½ ක් ඇතුලත විනය නියෝග නිකුත් කර අදාළ පර්ශවයට දැනුම්දී ඇත. **<u>04. මානව සම්පත් කළමනාකරණය</u>** 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල විස්තරය අනුව තොරතුරු තාක්ෂණ නිලධාරි එක් තනතුරක් සහ කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 02 ක් ඇතුළුව පුරප්පාඩු පවතින අතර, සංවර්ධන නිලධාරි 03 දෙනෙකුගේ අතිරික්තයක් විය. <u>වර්තමාන තත්ත්වය -</u> අදාළ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කරන ලෙස සහ අතිරික්ත සංවර්ධන නිලධාරීන් තුලනය කරන ලෙස ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත් ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022(vii) අනුව සේවක බඳවා ගැනීම් නතර කර ඇති නිසා දැනට සිටින කාර්ය මණ්ඩලය මගින් රාජකාරි ඉටු කරගන්නා ලෙස දැනුම්දීම අනුව කටයුතු කර ඇත. කාර්යාල සඳහා අනුමත කාර්ය මණ්ඩලය නොඉක්මවා සේවක පුරප්පාඩු සහ සේවක අතිරික්තතා කළමනාකරණය කර ගෙන ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
දෙවැනි කොටස : 95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2023 වසර තුල තත්වාගණනය කල විගණන මතයක් ලබාදීමට හේතු වූ කරුණු සම්බන්ධව විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. මේ අනුව 2025 වර්ෂයේදී තත්වාගණනය නොකල විගණන මතයක් ලබා ගැනීමට හැකි වී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - ප්‍රාදේශිය සම්පත් සංවර්ධන අධිකාරිය - වයඹ

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-62.00	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	මේ වන විට නියමිත කාලසීමාව ඇතුලත විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කරනු ලැබේ.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොමැති අතර කාර්ය මණ්ඩල ඌනතාවයක් පවතී.
සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	මේ වන විට අධිකාරිය සතු වාහනවල අයිතිය සනාථ කරන ලිපි සියල්ල සන්තකයේ ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබේ.
ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
ණය ගැනි ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ණයගැනි ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
ලැබෙන චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ලැබෙන චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව ආයතනය තුල මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණි.	මේ වන විට පළාත් මූල්‍ය රීති ප්‍රකාරව ආයතනය තුල මූල්‍ය බලතල පැවරීම සිදුකර ඇත.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි.	මේ වන විට මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර ඇත.
මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම අවම තරමින් නිළධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක් වන පරිදි බලතල පවරා නොතිබුණි.	මේ වන විට සෑම ගණුදෙනුවක්ම අවම තරමින් නිළධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක් වන පරිදි මූල්‍ය බලතල පවරා ඇත.
අධිකාරියට අදාළව ප්‍රඥප්ති අනුව මූල්‍ය හා පරිපාලන රීති පිළියෙළ කර නොතිබුණි.	අධිකාරියට අදාළ ප්‍රඥප්තිය අනුව මූල්‍ය හා පරිපාලන රීති පිළියෙළ කර නොතිබුණද රජයේ

	මුදල් රෙගුලාසි සහ පළාත් මූල්‍ය රීති අනුව කටයුතු කරගෙන යනු ලැබේ.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	වයඹ පළාත් සභාවේ සියළුම ආයතන පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් විගණනය කරනු ලබයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇති අතර ඔවුන්ගේ වාර්ෂික විගනන සැලැස්මට මෙම ආයතනයද ඇතුළත් වේ.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මේ වන විට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරන බව දන්වමි.
2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මින් ඉදිරියට සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	මින් ඉදිරියට පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.
සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	මේ වන විට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා ගෙන යනු ලැබේ.
ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම සිදුකර තිබුනි.	ප්‍රතිපාදන ඉක්මවා දරන ලද වියදම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.
ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	මේ වන විට නියමිත ප්‍රතිපාදන ඉක්මවන හෝ ඉතිරිවන අවස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වැය ඇසුතමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කර ඇත.
වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	මේ වන විට වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ කිසිවක් නොමැති බව දන්වමි.

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු /වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග**
දෙවැනි කොටස -55.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට මූලික අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය නිර්මාණය කිරීමත් සමඟ මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දිය හැකි බව දන්වමි.
ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි	ඉදිරියේදී පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කරන බව දන්වමි.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ විධි විධාන අනුව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මේ වන විට කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කරන පරිදි මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු නම් කර නොතිබුනි.	ඉදිරියේදී මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු නම් කිරීමට කටයුතු කරනු ලැබේ.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය සියයට 50කට වඩා අඩු මට්ටමක පැවතුනි.	ඉදිරියේදී සැලසුම්ගත පුහුණු අවස්ථා සියල්ල ලබා දීමට කටයුතු කරන බව දන්වමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	ඉදිරියේදී යහපත් විගණන මතයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලබන බව දන්වමි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස - 93.00	
සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒවායේ වාර්තා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	විගණිත දිනය වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුනද 2023 වර්ෂය සඳහා, • කුලියාපිටිය සෙයිකි පෙර පාසල - 2024.08.15 • සකුරා පෙර පාසල සහ පුහුණු ආයතනය - 26/2024.04.25 ,2024.03.28 • පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය 27/2024.03.12 යන දිනයන්හිදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අණාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණයේ ඌණතා නොවූ අතර අතිරික්තව තිබූ අයිතමයන් මේ වන විට අදාල ලේඛණ වලට ඇතුලත් කර ඇත.
සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	මේ වන විට කාර්තුවකට 1 බැගින් වසරකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් පැවැත්වේ.
දෙවැනි කොටස - 43.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණ කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට වෙබ් අඩවියේ නිර්මාණ කටයුතු සිදුකරමින් පවතී.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ඉදිරියේදී මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව ලබා දීමට අපේක්ෂිතය.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	මේ වන විට පුරවැසි ප්‍රඥප්තිය හා අදාල කටයුතු 90%ක් පමණ නිම කර ඇත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

සකස්කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සෑම නිලධාරියකුම පුහුණු අවස්ථා සම්පූර්ණ කර ඇත.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2/2018/1 හා 2023.11.30 දිනැති රා.ප.ව මඟින් කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම හා ගිවිසුම්ගත කිරීමේ අවශ්‍යතාවය අහෝසි කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර නොතිබුණි.	ආයතනයේ පරිපාලන නිලධාරිනිය මේ සඳහා නම් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි.	සෑම නිලධාරියකුම පුහුණු අවස්ථා සම්පූර්ණ කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාචන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	මේ වන විට ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ගිණුම්කරණ කටයුතු සිදු කරන අතර ඉදිරියේදී යහපත් විගණන මතයක් බලාපොරොත්තු වේ.
ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්ය භාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	1.පෙරපාසල් ගුරුවරුන් පුහුණු කිරීම. 2.පෙරපාසල් ලියාපදිංචිය හා නියාමනය. 3.ලියාපදිංචි පෙරපාසල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.
පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග වර්තමානය වන විට ක්‍රියාත්මක කරනු ලබයි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් පරිසර අධිකාරිය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස-71.00	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	2023 වර්ෂයේ මසක් ඉක්මයාමට පෙර පිළිතුරු ලබා දී ඇති අතර, වර්තමානයේ ද ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබා දීමට කටයුතු කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබීම.	සීමාව ඉක්මවා මෙම අධිකාරිය වෙත බඳවා ගැනීම් සිදු කර නොමැත.
සියළු වාහනවල අයිතිය තහවුරු කෙරෙන ලිපි සන්තකයේ නොමැත.	PH – 0262 - HO- 1283 - 301- 9999 - } පළාත් පරිසර අධිකාරිය සතුය. 53 - 1039 - ප්‍රධාන ලේකම් සතුව පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නිවැරදි කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කරමින් නිවැරදි කර ඇත.
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
ණය ගැනි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර ඇත.
අධිකාරියට අදාළව ප්‍රඥප්ති අනුව මූල්‍ය හා පරිපාලන නීති පිළියෙල කර නොතිබුණි.	සකස් කර ඇති අතර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතයි.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර නොතිබුණි.	පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන්නකි.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	පළාත් අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නොමැත.
2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන්නකි.

පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මෘදු පිටපත ඉදිරිපත් කර ඇත.
ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	සූර්ය බල ශක්තිය - විදුලි බිලෙහි අයිතිය පළාත් පරිසර අධිකාරිය වෙත නොතිබූ බැවින් එහි අයිතිය පළාත් පරිසර අධිකාරිය වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ. වන වදුල - 2023 වර්ෂයේ ව්‍යාපෘති වාර්තා ප්‍රමිතිගත යෝජිත පිරිවිතර ප්‍රමාණවත් නොවූ හෙයින් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය .මේ වන විට ක්‍රියාත්මක කර ඇත. වාහනයක් මිලදී ගැනීම - ඒ වන විට වාහන මිලදී ගැනීම අත්හිටුවා තිබුණි. මේ වන විට වයඹ ප්‍රධාන අමාත්‍යාංශය මඟින් , ප්‍රධාන ලේකම් මඟින් කොම්ප්ට්ලර් ජෙනරාල් වෙත 2026.04.10 දින යොමු කර ඇත.
වර්ෂයකට වඩා වැඩිකාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. හිඟ හිටි ණය ගැති ශේෂ වල කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි.	EIA - මාගා 2025.03.24 දින රු.11,280.00 ගෙවා අවසන් කරන ලදි. - ඩජ්බේ 2026.06.02 දින රු.36,409.00 ගෙවා අවසන් කරන ලදි
දෙවැනි කොටස - 73.00	
ආයතනයේ පුරවැසි සේවාසිලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධික්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අධික්ෂණය සඳහා නිළධාරීන් තිදෙනකු පත් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2025 වර්ෂයේ ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 75 % කි. නිවැරදි කරගනිමින් පවති.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ තත්ත්වාගණනය කළ මතය ලබා දී ඇත. (NWPC/D/NWEA/03/23/42 හා 2024.05.16 දින විගණකාධිපති වාර්තාව) විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි
සියළු නිළධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	සියළු නිළධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නිවැරදි කර ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිළධාරීන් පිළිබඳ ආයතන ප්‍රධානියා විසින් උචිත බලධාරියා දැනුවත් කර නොතිබුණි.	සියළු නිළධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නිවැරදි කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ ජනකලා පදනම

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස:79.00	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාදකිරීම් නිරීක්ෂණය විය.	ප්‍රවර්ථන වර්ෂයේ සිට විගණන විමසුම් සඳහා අදාල කාලය තුළ පිළිතුරු සැපයීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
සීමාව ඉක්මවා කාර්යමණ්ඩලය බඳවාගෙන තිබුණි .	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන නොතිබුණි. වයඹ ජනකලා පදනමේ කම්කරු තනතුරු සඳහා 04 දෙනෙකු අනුමතව පවති. නමුත් හලාවත විස්කම් නිවසේ සේවය කළ එක් කම්කරු නිලධාරිනියක් ස්ථාන මාරු කර ඇති අතර ඇය ස්ථාන මාරු නියෝග අනුව ක්‍රියාත්මක නොවී සේවයට වාර්තා නොකිරීම මත සේවය අතහැර ගියා සේ සලකා නියෝග නිකුත් කර ඇත. ඉන් ඇති වූ පුරප්පාඩුව සඳහා හලාවත විස්කම් නිවසට කම්කරුවෙකු බඳවාගෙන ඇත. ඉවත් කල නිලධාරීනිය යොමු කල අභියාචනය සලකා බලා නැවත සේවයේ පිහිටුවා ඇත.තවද කටුනායක අලෙවිසැලේ සේවය කළ නිලධාරිනියකු විනය නියෝග මත කම්කරු තනතුරුට සේවයෙන් පහත දමා ඇත. ඒ අනුව අනුමත කම්කරු නිලධාරි සංඛ්‍යාව ඉක්මවා 6 දෙනෙකු ලෙස කාර්ය මණ්ඩල වාර්තාව තුල පෙන්නුම් කරනු ලබයි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි	සංචිත වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා 2025 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා විගණන කාර්යාලය වෙත යවා ඇත. අංක 2033-6850 දරන ත්‍රිවිල් රථය සහ 52-0735 දරන කැබ් රථය අපහරණය කිරීම සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා2025.09.02 දරන ලිපියෙන් ප්‍රධාන අමාත්‍යාංශයට දැනුම් දී ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් වල ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ පිළිබඳව අදාල පුද්ගලයින් දැනුවත් කර ශේෂ නිරවුල් කර ඇත.
හානී පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත	වර්තමානයේ හානිපාඩු ලේඛණයක් පවත්වාගෙන යනු ලබන බව දැනුම් දෙමි.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොකිබුණි.	මූල්‍ය බලතල පැවරීම සම්බන්ධව අදාල අංශ වල ප්‍රධානීන් හට පිටපත් ලබා දී ඇත.මූල්‍ය බලතල පැවරීම දැන්වීම් පුවරුවේද ප්‍රදර්ශණය කර ඇත

අධිකාරියට අදාළව ප්‍රඥප්ති අනුව මූල්‍ය හා පරිපාලන නීති පිළියෙළ කර නොතිබුණි.	ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් වන අතර ජනකලා පදනමට වෙනමම මූල්‍ය හා පරිපාලන නීති පිළියෙළ කර නොමැති අතර පළාත් සභාවට අයත් චක්‍රලේඛ,මූල්‍ය නීති හා ආයතන සංග්‍රහය අදාල කරගන්නා බව දැනුම් දෙමි.
වර්ෂයකට වඩා කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	වසරකට වැඩි කාලයක් තිස්සේ පවතින හිඟ ශේෂයන් දැනටමත් පියවා ඇත.
දෙවැනි කොටස-70.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.ආයතනය පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවියක් නිරිමාණය කර ඇති අතර මහජනයාට තොරතුරු ලබා දීමට හැකියාව තිබුණද මහජනයාට පැමිණිල් හා ප්‍රසංසා සටහන් කිරීමටහැකියාවක් නොතිබුණි.වෙබ් අඩවිය ක්‍රියාත්මක කිරීමේ ගැටළු පැන නැගීම හේතුවෙන් වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණික ඒකකය සමඟ සාකච්ඡා කර නව වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	ජනකලා පදනමේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට අදාළ කාර්ය අනුව රාජකාරි ලැයිස්තු ලබා දී ඇත. ඉදිරියේ දී කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතවීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	ගිණුම් පිළිබඳ විගණන මතය තත්වා ගණනය කළ මතයක් වන බැවින් තත්වා ගණනය නොකළ මතයක් ලබා ගැනීමට ප්‍රවර්තන වර්ෂයේ සිට කටයුතු කරනු ඇත.
ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්ය භාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනයේ කාර්ය දර්ශකයන් ලෙස පහත දර්ශකයන් හඳුනාගෙන ඇත. අලෙවි සැල්වල වාර්ෂික සත්‍ය ආදායම වාර්ෂික සත්‍ය ආදායම (34D+හලාවත+කුරුණෑගල+රිදීගම)x100 සහ ඇස්තමේන්තු ගත ආදායමේ ප්‍රගතිය වා.ඇස්.ආදායම(34D+හලාවත+කුරුණෑගල+රිදීගම) වාර්ෂික සත්‍ය බදු ආදායම වාර්ෂික සත්‍ය බදු කුලී ආදායම x100 සහ ඇස්තමේන්තු ගත බදු ආදායමේ ප්‍රගතිය වා.ඇස්.බදු කුලී ආදායම වාර්ෂිකව සත්‍ය වශයෙන් පවත්වන ලද සංස්කෘතික වැඩසටහන් සංඛ්‍යාව වාර්ෂිකව ස. වැ.සංඛ්‍යාව x100 අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වා.අපේක්ෂිත වැ.සංඛ්‍යාව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස : 80.00	
විගණන විමසුම් සඳහා පිලිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයක්ට ප්‍රමාද කිරීම නිරීක්ෂණය විය.	සියලු විගණන විමසුම් සඳහා ප්‍රමාද කිරීමකින් තොරව පිලිතුරු සපයා ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 131 ක් වුවද ස්ථීර පදනම මත 60 ක් හා කොන්ත්‍රාත් පදනම මත 16 ක්ද සේවයේ යෙදී සිටින අතර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය සේවය සඳහා බඳවා ගෙන නොමැත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි / වාහනයක් ගර්හිත වී මාස 8ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර 2024.01.29 දින වාර්තාව ලබා දී තිබූ අතර එහි ඌනතා හා අතිරික්තතා සම්බන්ධව කටයුතු කිරීම පිණිස පත් කල කමිටුව විසින් භාවිතයට ගත නොහැකි හා අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන යන්ත්‍ර හා වාහන පිළිබඳ කමිටු වාර්තාව මේ වන විට භාරදී ඇති අතර මෙම වර්ෂය තුල එම යන්ත්‍ර හා වාහන අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	ක්‍රමවත් හා විධිමත් ලෙස වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යාම සඳහා නිළධාරියකු වෙත පවරා ඇති අතර ඔහු විසින් ලොග් පොත් වල මුල් සටහන් ඇතුලත් කරමින් පොත් යාවත්කාලීන කිරීම සිදු කර ගෙන යනු ලැබේ.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	වර්තමානයේදී එම තත්වය නිරවුල් කර ඇත.
ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	වර්තමානයේදී ආයතනය සතු යන්ත්‍ර හා වාහන සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුණි.	2023.12.31 දිනට විගණන විමසුමේ සඳහන් ශේෂය වන රු. 63,212,431.89 ක මුදලෙන් 2026.05.31 දින වන විට රු. 52,522,389.29 ක මුදලක් අයවී ඇති අතර රු. 10,690,042.60 ක මුදලක් තව දුරටත් ලැබීමට හිග මුදල් ලෙස පවතී. වර්ෂ 1998-2004 කාලයට අදාලව හිග කුලී ගාස්තු ලෙස පැවති රු 7,049,984.87 ක මුදල හා 2009 - 2019 කාල සීමාවට අදාලව හිග කුළි ගාස්තු , හිග අළුත්වැඩියා ගාස්තු හා හිග වාහන සේවා ගාස්තු

	වශයෙන් පැවති රු. 2,971,201.88 ක මුදලේ එකතුව ලෙස විමසුමේ දක්වා ඇති රු10,021,186.75 ක මුදල අයකර ගැනීම සඳහා අප විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදි. වාචිකව මෙන්ම ලිඛිතව අදාල ආයතන දැනුවත් කල නමුත් මෙම මුදලින් මේ වන විටත් වසර 20කට වඩා පැරණි කුළි ගාස්තු ණය ශේෂ වල එකතුව ලෙස රු. 7,049,984.87 ක මුදලක් අයවීමට පැවති අතර ඒම මුදල අය කර ගැනීමට පවතින අපහසුතාවය මත අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කල ඉල්ලීම අනුව හිග කුලී ගාස්තු වටිනාකම වන රු 7,049,984.87 ක මුදල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ NWP/PT/R/04/17/IV හා 2026.05.06 දිනැති ලිපියෙන් යන්ත්‍රෝපකරණ අධිකාරියේ සමුච්චිත ලාභයට එරෙහිව කපා හැරීමට අනුමත කර ඇත. 2023.12.31 දිනට විගණන විමසුමේ සඳහන් ශේෂයේ 2026.05.31 දිනට වර්තමාන ශේෂය රු.3,640,057.73 ක් බව කාරුණිකව දන්වමි.

දෙවැනි කොටස - 70.00	
ආයතනය පිලිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	වර්තමානයේදී වෙබ් අඩවිය අක්‍රීය තත්වයේ පවතින නමුත් එය හැකි ඉක්මනින් යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ.
මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබූ අතර එම සැලැස්ම මගින් කාර්ය මංඩලයේ 50% වැඩි පිරිසකට වර්ෂයකට අවම පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්ම හා පුහුණු සැලැස්ම 2024 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබන අතර ඒ අනුව පුහුණු අවස්ථා සඳහා නිළධාරීන් යෙදවීම සිදු කරනු ලැබේ.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂඨ නිළධාරියෙකු නම් කර නොතිබුණි	මේ වන විට ඒ සඳහා නිලධාරීන් නම් කර ඇත
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% අඩු ප්‍රමාණයක පැවතින	වර්තමානයේදී පුහුණු අවස්ථා ලබාදීම නිසියාකාරව සිදු කරනු ලැබේ.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ විගණන මතයක් ලැබී ඇති අතර විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාත් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස : 75.00	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	අදාල අංශ වලින් තොරතුරු ලබාගැනීමේ ප්‍රමාදය නිසා මෙවැන්නක් ඇතිවිය. වර්තමානයේ දී මෙවැනි තත්ත්වයක් ඇතිනොවීමට කටයුතු කරන මෙන් විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලදී.
අනුමත සීමාව ඉක්මවා කාර්යමණ්ඩලය බඳවාගෙන තිබුණි.	කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි.සියලු විෂය නිළධාරින් දැනුවත් කර මේ වන විට නියමිත දිනට බැංකු සැසඳුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරනු ලබයි.
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	තැම්පතු හඳුනාගැනීමේ අපහසුතාවය මත මෙම ගැටලුව මතුව තිබුණි .මේ වන විට මෙම තත්වය නිරවුල් කර ඇත.
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
අභයන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	පිළිතුරු සැපයීම ප්‍රමාද වී තිබුණේ ඇතැම් පිළිතුරු ලබා දීම ප්‍රමාද වීම නිසාය. වර්තමානයේ දී මෙවැනි තත්ත්වයක් ඇතිනොවීමට කටයුතු කරන මෙන් විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලදී.
ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	මේ වන විට මෙම තත්ත්වය මගහරවාගෙන ඇති අතර ඉදිරියේදී මෙවන් තත්ත්වයක් ඇතිනොවීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලදී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	චක්‍රීය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන බැවින් මෙම තත්ත්වය ඉදිරියේදී ද පවතී
දෙවැනි කොටස : 80.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වේබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීමට අවස්ථාව සලසාදීමේ අරමුණින් වේබ් අඩවියක් නිර්මාණය කර මහජනයාට නිරාවරණය කර ඇති අතර එයට අදාල සියලුම කටයුතු වර්තමානය වන විට අවසන් කර ඇති බව වැඩි

	දුරටත් දන්වා සිටිමි.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වේබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වේබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණු බැවින් එය කඩිනමින් ඉටු කිරීමට මaදුකාංග ආයතනය දැනුවත් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2025 වර්ෂයේ මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරින්ට පැය 12 ක පුහුණු අවස්ථාවක් සහතික කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරිමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු නම් කර නොතිබුණි.	2025 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරිමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල නිළධාරියෙකු නම් කරන ලදී.
සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පුහුණුලාභීන් කැඳවා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් 2024 වර්ෂයේදී සැලසුම්ගත පුහුණු ප්‍රමාණය පවත්වා ගැනීමට නොහැකි විය.ඉදිරියේදී මෙම පුහුණු අවස්ථා සැලසුම්ගත ප්‍රමාණයම පැවැත්වීමට වගබලා ගන්නා බව දැනුම් දෙමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය	වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාවට අනුව තත්ත්වාගණනය කළ මතය ලැබී ඇත.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	වර්තමානයේ දී වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරිමට නිලධාරින් කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම- වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස - 83.00	
මාසයකට වැඩි කාලයක් තිස්සේ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය	ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය දෙදෙනෙකුට සීමා වීම නිසා, දෛනික රාජකාරි සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය නිසා යම් ප්‍රමාදයක් සිදුවිය. කෙසේ වෙතත්, අනාගතයේදී නියමිත කාල රාමුව තුළ ප්‍රතිචාර දැක්වීමට අපි බලාපොරොත්තු වෙමු.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගන තිබුණි	2013 වර්ෂයේදී අවසන් වරට කාර්ය මණ්ඩල අනුමත සංඛ්‍යාව (Cadre) සංශෝධනය කරනු ලැබීය. කර්මාන්ත සේවා කාර්යාංශය ස්වයංපෝෂිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බැවින්, ආයතනයේ ආදායම් ඉලක්ක සපුරා ගැනීම සහ සේවා කාර්යක්ෂමතාව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, අනුමත සංඛ්‍යාවට අමතරව අවශ්‍ය වූ කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සිදුව ඇත. මේ අතර, කාර්ය මණ්ඩල අනුමත සංඛ්‍යාව යළි සංශෝධනය කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.
වාර්ෂික වෙළඳ භාණ්ඩ සමීක්ෂණය මගින් අනාවරණය වන අතිරික්තයන්, හිඟයන් සහ අනෙකුත් නිර්දේශ පිළිබඳ නිර්දේශ නියමිත කාල රාමුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි	ආයතනයේ සීමිත කාර්ය මණ්ඩලය හේතුවෙන් 2023 දී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, 2025 වාර්ෂික වෙළඳ භාණ්ඩ සමීක්ෂණයෙන් හෙළි වූ නිර්දේශයන්ට අනුව ආයතනය විසින් බැහැර කිරීමට හඳුනාගත් අයිතම 2026 මැයි 8 වන දින වෙන්දේසි කරන ලදී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂයන් පැවතුනි	වසරකට වැඩි කාලයක් ණය ගෙවීමට ප්‍රමාද වූ ණය ගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා ආයතනය මතක් කිරීමේ ලිපි යැවීය. ඊට අමතරව, දිගු කලක් ණය අයකර ගැනීමට නොහැකි වූ ණය ගැතියන් සමඵ මණ්ඩලයට යොමු කිරීම ද අවශ්‍ය විය.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුනි.	මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව වූයේ ක්ෂේත්‍ර මෙහෙයුම් සහ ව්‍යාපෘති ආශ්‍රිත ක්‍රියාකාරකම් අතරතුර දරන ලද වියදම් පියවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට ගතවන කාලයයි. කෙසේ වෙතත්, අත්තිකාරම් ලබා ගත් දින සිට වැඩ කරන දින දහහතරක් (14) ඇතුළත සියලුම

	අත්තිකාරම් පියවීම් සම්පූර්ණ කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර දැන් ක්‍රියාත්මක කර ඇති අතර, ඉදිරියට යන විට මෙම අවශ්‍යතාවයට දැඩි අනුකූලතාවයක් පවත්වා ගනු ඇත.
පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුනි.	වටිනාකම රු. 100,000.00 ඉක්මවා ගෙවනු ලබන ව්‍යාපෘති අත්තිකාරම් අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතියකට යටත්ව ලබා දීමට කටයුතු කර ඇත. එවැනි මුදලක් අත්තිකාරම් ලෙස ලබාගෙන ඇත්තේ ව්‍යාපෘතිවලට අදාළ සහභාගීවන්නන්ගේ දෛනික දීමනා ගෙවීම සඳහාම පමණක් බව තහවුරු කර සිටිමි. විශේෂයෙන්ම කාර්යාංශය විසින් 2018 වර්ෂයේ සිටම කෘෂිකර්ම නවීකරණ වැඩසටහන හා සම්බන්ධව විවිධ ව්‍යාපෘති ගණනාවක් සිදු කර ඇති අතර, 2023 වර්ෂයේ දී ද තෝරා ගත් පළාත් 05ක දිස්ත්‍රික්ක 12ක් අරමුණු කරගෙන ගොවි ව්‍යාපාර පාසල තුලින් ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නංවන ලදි. මේ යටතේ පවත්වන ලද පුහුණු සැසි සඳහා සහභාගී වන ගොවීන් හට පැමිණීමේ දීමනා ලබා දීම සඳහා පමණක් මෙම අත්තිකාරම් නිකුත් කර ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.කෙසේ වෙතත් වර්තමානයේ දී මෙලස අනුමත සීමාව ඉක්මවා අතුරු අග්‍රිම දීම සම්පූර්නයෙන්ම නවතා ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ විගණන මතයක් ලබාදී ඇති අතර, විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුනි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකල අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින්ත උචිත බලධාරීන් දැනුවත් කර නොතිබුනි	වත්කම් සහ බැරකම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු අදාළ නිලධාරීන් මේ වන විට අදාළ ප්‍රකාශන ඉදිරිපත් කර ඇත

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492
ආයතනයේ නම - වයඹ සංවර්ධන අධිකාරිය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය**
පළමු කොටස- 80.00	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම නිරීක්ෂණය විය.	පිළිතුරු සකස්කල වහාම විද්‍යුත් තැපෑලෙන්ද යොමු කරන බැවින් හා විගණන විමසුම් ලේඛණය අනුව පිළිතුරු සැපයීමේ කාල සීමාව ප්‍රමාද වී නොමැත.
වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	මේ වන විට අදාල වාහනය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත 2024.02.21 වන දින 54 – 7728 අංක දරණ කැබ් රථය බාරදී ඇති අතර එම වටිනාකම වත්කම් ලේඛණයෙන් මේ වන විට ඉවත් කර ඇත
අධිකාරියට අදාලව ප්‍රඥප්ති අනුව මූල්‍ය හා පරිපාලන නීති පිළියෙල කර නොතිබුණි.	වයඹ පළාත් සභාව විසින් සකස්කර ඇති පළාත් මූල්‍ය රීති සහ කාර්ය පරිපාටික නීති අධිකාරියට අදාල කරගෙන ඇති බැවින් නව නීති පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැඟිනි.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තාවීම	අදාල පිළිතුර 2024.02.21 වන යවා ඇත.
සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමණාකරන කමිටු නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023.04.04, 2023.10.13, 2023.12.29 යන දිනයන්හි විගණන හා කළමණාකරන කමිටු 03 ක් පවත්වා ඇති අතර මේ වන විට කාර්තුමය වශයෙන් පැවැත්වීමට කටයුතු කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	මේ වන විට පැවත එන හිඟ ණය ශේෂ වලින් රු. 919,170.00 ක් අයකර ගෙන ඇත.

දෙවන කොටස : **83.00**	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මේ වන විට කාර්ය මණ්ඩලය සඳහා පැය 12 ක පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබිණි.	වයඹ සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, එච්. ඒ.අයි.පී. කුමාර මහතා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ජ්‍යෙෂ්ඨ නිළධාරියා ලෙස එවකට පත්කර තිබුණි.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පුහුණු අවස්ථාවන් ගණන වැඩිකර ගැනීමට කටයුතු කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ විගණන මතයක් ලබාදී ඇති අතර, විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාත් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.
සියළු නිළධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු නිළධාරීන් වැඩ බැලීමේ පදනම මත පත්කර ඇති බැවින් එම නිළධාරීන්ගේ නිත්‍ය සේවා ස්ථානයෙන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - වයඹ පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය

කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
පළමු කොටස-86.00	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම නිරීක්ෂණය විය.	වර්තමානය වන විට මෙම දුර්වලතාවය නිවැරදි කර ඇති අතර,පිළිතුරු ප්‍රමාද වන අවස්ථාවන්හිදී අතුරු පිළිතුරු සකස් කර ඉදිරිපත් කරනු ලැබේ
වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	වර්තමානය වන විට මෙම දුර්වලතාවය නිවැරදි කර ඇති අතර,විගණනයෙන් පෙන්වා දෙන ලද මෙම වාහනය 2025 වර්ෂයේදී අපහරණය කර ඇත.
ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2026 වර්ෂය වන විට වත්කම් ලේඛණය සකස් කර ඇති අතර,යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි	ආයතනයේ පාලනයෙන් බැහැරව පිහිටුවා ගන්නා ලද බස් සමාගම් හේතුවෙන් මෙම අයකරගත නොහැකි හිඟ ශේෂ පවතින අතර, හලාවත සහ කුලියාපිටිය බස් නැවතුම්පළවල් කේන්ද්‍ර කරගනිමින් බස් ධාවනය කරනු ලබන අන්තර් පළාත් බස්රථ බස් සමාගම් පිහිටුවා ආයතනික ගාස්තු ගෙවීම පැහැර හැර ඇත.මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ආයතනය විසින් ගෙන ඇත.වයඹ පළාත තුල පොදු මගී ප්‍රවාහන සේවා නියාමනය කිරීම සඳහා එක් නීති පද්ධතියක් පමණක් නොවීම හේතුවෙන් මෙම ගැටළුව පැන නැගී ඇත.
දෙවැනි කොටස-92.00	
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි	2024 වර්ෂයේ සිට කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වී ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	කළමනාකරණ සහ මෙහෙයුම් අකාර්යක්ෂමතා මගින් හෙළිදරව් කර ඇති කරුණු හේතුවෙන් ගිණුම් සඳහා වන විගණන මතය, හැර මතයක් ලෙස පවතී. විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු හැකිතාක් අවම කර ගනිමින් ඉදිරියේදී යහපත් මතයක් ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කරමි.

2026/02/09

අයි.එම්.අයි. ඉලංගකෝන්
ප්‍රධාන ලේකම්
වයඹ පළාත